ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 2005 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2005 අප්‍රේල් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2005 අප්‍රේල් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00යි

# 2005 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 අප්‍රේල් මස 20 වන දින]

එල්. ඩී.–ඕ. 26/2004.

**කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ 6 වන වගන්තිය, ඒ වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "දින තුනක් වන පොරොත්තු කාලය ඉකුත් වූ පසුව" යන වචන අත්හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *(139 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(i) එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයෙහි "එකතුව රුපියල් දහසක් නොඉක්මවන මුදලක්" යන වචන වෙනුවට "එකතුව රුපියල් දස දහසක් නොඉක්මවන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි (2) වන උපවගන්තියෙහි "රුපියල් සියයකට අඩු නොවූ" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට අඩු නොවූ" යන වචන ආදේශ කිරීමෙන්.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (i), (ii), (iii) යන ඡේද ඉවත්කොට ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(i) වන්දිය රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන අවස්ථාවක, රුපියල් දස දහස නොඉක්මවන මුදලක් ;

(ii) වන්දිය රුපියල් තුන්ලක්ෂයක් නොඉක්මවන අවස්ථාවක, රුපියල් පහළොස් දහස නොඉක්මවන මුදලක් ;

(iii) වන්දිය රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන අවස්ථාවක, රුපියල් විසි දහස නොඉක්මවන මුදලක්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ.

"IV වන උපලේඛනය" (6 වන වගන්තිය)

ඇතැම් අවස්ථාවල දී ගෙවිය යුතු වන්දි මුදල්

වන්දි මුදල් ප්‍රමාණය

| (1) *තුවාල ලත් කම්කරුවාගේ මාසික වේතනය* | | (2) *කම්කරුවාගේ මරණය* | (3) *කම්කරුවාගේ ස්ථිර සම්පූර්ණ අබලතාව* | (4) *කම්කරුවා තාවකාලිකව අබලතාවට පත්වීම වෙනුවෙන් වන්දි වශයෙන් අර්ධ මාසික ගෙවීම* |
|---|---|---|---|---|
| *රු.* | *රු.* | *රු.* | *රු.* | *රු* |
| 0 - | 2,500 | 1,81,665. 00 | 196,083. 80 | 1,320. 00 |
| 2,501 - | 5,000 | 2,58,640. 80 | 2,95,075. 00 | 1,804. 00 |
| 5,001 - | 7,500 | 3,30,968. 00 | 3,51,461. 00 | 2,186. 80 |
| 7,501 - | 10,000 | 4,07,427. 90 | 4,44,494. 60 | 2,733. 50 |
| 10,001 - | 12,500 | 4,78,495. 60 | 5,19,593. 80 | 3,231. 80 |
| 12,501 - | 15,000 | 5,22,495. 60 | 5,50,000. 00 | 3,561. 80 |
| 15,001 - | 17,500 | 5,49,631. 50 | 5,50,000. 00 | 3,890. 70 |
| 17,501 - | 20,000 | 5,50,000. 00 | 5,50,000. 00 | 4,221. 80 |
| 20,001 - | සහ ඊට වැඩි | 5,50,000. 00 | 5,50,000. 00 | 5,500. 00 |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.